6

අල් කලාද වල් කද්ර්

مَا فَرَّطْنَا فِى الْكِتٰبِ مِنْ شَىْءٍ ثُمَّ إِلٰى رَبِّهِمْ يُحْشَرُوْنَ

"(මේවායින්) කිසි ම එකක් (අපේ ලේඛන) පොතේ සඳහන් කර අත් හැරියේ නොමැත; තව ද එම සියලු දේ ම ඒවායේ දෙවියන් ළඟ එක් රැස් කෙරේ."
(6 අල් අන්ආම් :38)

කලා කද්ර් පිළිබඳ විශ්වාසය ඊමානයේ ප්‍රධාන අංගයකි. කලා යන වචනයෙන් මැවීම, විසඳීම, ඉෂ්ඨ කිරීම යන අර්ථ ද කද්ර් යන වචනයෙන් ස්ථිර නිගමනය, පෙර මිනුම, ප්‍රමාණය යන අරුත්ද ගෙන දෙයි. ඉස්ලාමීය අකීදවෙහි එම පද දෙක අල්ලාහ්ගේ ඥනය (ඉල්ම්) අතිදක්ෂතාව (කුද්රත්) අභිමතය (ඉරාදත්) ආදිය හා සම්බන්ධ වේ. අකීද ක්ෂේත්‍රයේ විශේෂඥයින් කලා කද්ර් යන්න අකීදහි ඉලාහීයියත් යන අංශයේ ඇතුළත් කර ඇත.

කලා කද්ර් යන්න, විශ්වාසය හා සම්බන්ධ සිද්ධියක් වන හෙයින් එය වහී පදනම මත වූ අල් කුර්ආනයේ ද හදීසයේ ද මග පෙන්වීම තුළින් විශ්වාස කළ යුතු ය. වහී දැනුම අන්ධකාරයේ ගමන් කරන මිනිසකු අතැති පහනක් සේ වීම එයට හේතුව යි. ශුෂ්ක ශාක පඳුරු ආදී දුෂ්කරතාවලින් සපිරි අඳුරු මාර්ගයක යන බුද්ධිමත් පුද්ගලයෙකු පහනක් නොමැති ව ගමන් නොකරයි. එලෙසින් ම වහී වලින් තොරව බුද්ධිය පමණක් පදනම් කර ගනිමින් මේ පිළිබඳ ව සිතීමෙන් වැරදි නිගමනවලට එළඹේ.

ඉස්ලාමීය ඉතිහාසයේ ජබරියියා, කදරියියා, මුඃතසිලා, මුර්ජියා ආදී චින්තන බෙදුම්වාදීන් බුද්ධිය පදනම් කර ගනිමින් ඊමානය හා සම්බන්ධ සිදුවීම් ගැන සිතූ බැවින් ම මේවා බිහි විය. මේවා වැරදි ඉස්ලාම් මතවාද වේ.

කලාකද්ර් පිළිබඳ තාර්කිකයන් තුළ විවිධ අදහස් දක්නට ලැබේ.

1. මිනිසාගේ කැමැත්තට ප්‍රමුඛත්වය දී කලා කද්ර් පිළිබඳ විස්තර කරන්නන්.

මොවුහු මිනිස් ජීවිතයේ ඇති වන ජය පරාජයට මිනිසුන්ගේ ක්‍රියා ම හේතු වේ යයි විශ්වාසය කරන්නෝ වෙති. සියල්ල සිදු වන්නේ දේව කැමැත්ත මත යන්න මොවුහු ප්‍රතික්ෂේප කරති. එහෙත් තම සැලැස්මට අභිමතයට හා උත්සාහය අභිභවා සිදු වන ඉරණමට විරුද්ධ ක්‍රියාවන්ට පිළිතුරු දීමට මොවුහු අසමත් ය.

2. මිනිසාගේ කැමැත්ත ප්‍රතික්ෂේප කර කලා කද්රය විස්තර කරන්නන්.

මොවුහු තමා විසින් කරනු ලබන හොඳ නරක සියල්ලට හේතු වන්නේ අල්ලාහ් බව පෙන්නුම් කරති. තම සිතැගියාවන්ට අනුව තමා විසින් කරනු ලබන පාපය සාධාරණයට ලක් කිරීමට ප්‍රයත්න දරන මොවුන් අල් කුර්ආනය දූඩි ලෙස හෙළා දකියි.

"අල්ලාහ්ට අභිමත වී නම් අපි ද අපගේ මුතුන්මිත්තන් ද (අල්ලාහ්ට කිසිවක්) ආදේශ කර නොසිටිමු. තව ද අපි කිසි දෙයක් තහනම් නොකර සිටිමු..." (6 අල් අන්ආම්: 148)

කලා කද්ර් පිළිබඳ විශ්වාසය සම්බන්ධයෙන් අල් කුර්ආන් හා අල් හදීස්හි විවරණය අපි දැන් විමසා බලමු. අල් කුර්ආන් හා හදීස් අනුව කලා කද්ර් පිළිබඳ මූලික කරුණු දෙකක් පෙන්නුම් කරයි.

1. සියල්ල අල්ලාහ්ගේ කැමැත්ත පරිදි සිදු වේ.
2. මිනිසාට ක්‍රියා නිදහස ලබා දී ඇති බැවින් ඔහුගේ සියලු ක්‍රියාවන්ට ඔහු ම වගකිව යුතු ය.

පළමු වන මූලික කරුණ තහවුරු කරන අල් කුර්ආන්, හදීස් මූලාශ්‍රය පහත සඳහන් වේ.

- "අල්ලාහ්ගේ කැමැත්ත මත මිස එහි එක් දුකක් හෝ සිදු නොවනු ඇත."
- "ඔහු කැමති අයට සමාව දෙන්නේ ය. ඔහු කැමති අයට දඬුවම් දෙන්නේ ය. අල්ලාහු සියලු දෙය කෙරෙහි බල සම්පන්න ය." (2අල් බකරා:284)
- (ගසකින්) කොළයක්වත් ඔහු දැන මිස බිම නොවැටේ.

(6 අල් අන්ආම්:59)

නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමා මෙසේ පැවසූ සේක. "ඔබලාගෙන් එක් එක් අය තම මවගේ ගර්භයේ දින හතළිහක් වූ පසු, එවැනි ම කාලයක් ඝන ලේ කැටියක් ලෙස ද, පසු ව එවැනි ම කාලයක් මාංශයක් ලෙස ද, සිටී. පසු එහි සටහන් මලාඉකාවරයකු යවනු ලැබ කරුණු සතරක් කරනු ලැබේ. ඒ අනුව එම මාලාඉකාවරයා ලවා භ්‍රෑණයේ ආහාරය ද, ක්‍රියාව ද, ආයු කාලය ද, සොම්නසින් පසු වන කෙනෙක් ද දොම්නසින් පසු වන කෙනෙක් ද යන වග සටහන් කරන ලෙස පවසනු ලැබේ. ඉන්පසු එයට ප්‍රාණය පිඹින්න යනුවෙන් ද පවසනු ලැබේ. මාගේ ප්‍රාණය කවරකු අත පවතින්නේ ද ඔහු මත නොමිලේ බෙදහැරීම සඳහා

සත්‍යවශයෙන් ම පවසමි. ඔබ අතරින් කෙනෙක් ස්වර්ගයට හිමි ක්‍රියා ම කරයි. එහෙත් ස්වර්ගය හා ඔහු අතර එක් රියනක පරතරයක් හෝ ඇත්නම් පෙර මිනුම ඔහු අභිභවා යයි. එබැවින් ඔහු නිරයට නියමිත ක්‍රියා කර නිරයට පිවිසේ. ඔබලාගෙන් එකිනෙකා නිරයට හිමි ක්‍රියා ම කරයි. නිරය හා ඔහු අතර එක් රියනක පරතරයක් ඇති විට පෙර මිනුම (කලා කද්රය) ඔහුව අභිභවා යයි. එබැවින් ඔහු ස්වර්ගයට නියමිත ක්‍රියාවන් කර ස්වර්ග යට ප්‍රවේශ වේ. (බුහාරි මුස්ලිම්)

ඉහත සඳහන් කළ අල් කුර්ආන් හදීස් මූලාශ්‍රය මඟින් අල්ලාගේ ඇති දක්ෂ බව, තේජස, ශක්තිය ඇත්තා යන්න හැඟවේ. සිදුවීමට නියමිත සියල්ල එයට පෙර ම ලියා තබා ඇත. මෙම විශ්වයේ ආයුෂ එක් එක් ජීවීන්ගේ ආයුෂ, එක් එක් මිනිසාට සිදු වීමට නියමිත ජය පරාජ, ලාභ අලාභ, සුව දුක්, ධන නිර්ධන පෘථිවියේ ඇති වීමට නියමිත ආපද, කෙනෙක් යහපත් ද අයහපත් ද යන තීරණය, ඔහුගේ පරම්පාරාව, වැනි සියල්ල අල්ලාහ් ලියා තබා ඇත. අල්ලාහ් ලියා තැබූ පරිදි ම සියල්ල සිදු වෙමින් පවතී. මෙයින් අල්ලාහ්ගේ කැමැත්ත කිසිවකු විසින් වෙනස් කළ නොහැකි ය, යන විශ්වාසය තහවුරු කෙරේ. කලා කද්ර් යනු මෙය යි.

දෙවන මූලික කරුණ තහවුරු කරන අල් කුර්ආන් හදීස් සාධක පහත දැක්වේ.

- යමෙක් යහකමක් කෙරේ ද එය ඔහුට ම ය, යමෙක් නපුරක් කෙරේ ද එය ඔහු මත ය. නුඹ හිමි තැනැත්තාට අන්‍යාය කරන්නේ නොවේ. (41 හාමීම් අස්සජද :46)
- ඔබට අත් වන ඕනෑ ම දුකක් ඔබගේ ඉන්ද්‍රියයන් මගින් ලබාගත් දෑය. (42 අෂ් ෂූරා :30)
- කවරකු එක් අණුවක තරම් හෝ කුසල් කරන්නේ ද එය ඔහු දකියි. කවරකු එක් අණුවක තරම් හෝ අකුසල් කරන්නේ ද එය ද ඔහු දකියි. (99 අස් සිල්සාල් :7-8)
- "නබි සලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණෝ මෙසේ පැවසූ සේක. බලවත් මූඃමින් වරයා බලරහිත මූඃමින් වරයාට වඩා අල්ලාහ්ට ප්‍රියවූවකු වේ. ඒ එකිනෙකා හට යහපත ඇත. ඔබට ප්‍රයෝජනවත් දේ හිමි කර ගැනීමෙහි උද්යෝගිමත් වන්න. අල්ලාහ් වෙතින් උදවු ලබා ගන්න. නොහැකි කෙනකු සේ නොහැසිරෙන්න. ඔබට යම් අයහපතක් සිදු වූයේ නම් මෙසේ කළා නම් එය සිදු නොවනු ඇත යයි නොපවසන්න. අල්ලාහ්ගේ කැමැත්ත පරිදි ම එය සිදු වූයේ යැයි පවසන්න" (මුස්ලිම්)
- උමර් රළියල්ලාහු අන්හු තුමා ඉදිරියට සොර දෙටුවෙකු ගෙන එන ලදි. එවිට සොරකම් කරනු ලැබුවේ මන් දැයි විමසන ලදි. එයට ඔහු "එය අල්ලාගේ කැමැත්ත පරිදි ම සිදු වූයේ" යැයි පිළිතුරු දුන්නේ ය. එවිට උමර් රළියල්ලාහු අන්හු තුමා ඔහුට කසපහර තිහක් දුන් පසු ඔහුගේ අත සිඳලන්න" යැයි තීන්දු දුන්නේ ය. එවිට ඔහු ඒ මන්දැයි විමසන විට සොරකමට අත සිඳලීම ද, අල්ලාහ් කෙරෙහි බොරු චෝදනා නැඟීම සඳහා කස පහර තිහ ද දෙනු ලැබේ යැයි පිළිතුරු දුන්හ.

ඉහත සාධක මගින් "අල්ලාහ් මිනිසාට පුණ්‍ය ක්‍රියා සඳහා නිදහස ලබා දී ඇත, ඔහු කැමති නම් හොඳ දේ කරයි, කැමති නම් නරක දේ කරයි, ඔහුගේ ක්‍රියාවන්ට ඔහු ම වගකිව යුතු ය." යන සත්‍යය පැහැදිලි වේ.

මතුපිටින් බලන විට ඉහත සඳහන් දෙක එකිනෙකට විරුද්ධ වන ලෙස පෙනේ. එම හේතුව නිසා සාමාන්‍ය මිනිසුන් අතර කලා කද්ර් පිළිබඳ විවිධාකාර වූ මායා දක්නට ලැබේ. ඊමානය හා දැනුම ඇති මිනිසා ඒ දෙක අතර ඇති ගැඹුරු සම්බන්ධතාව දැන, ඒ අනුව ම තම ජීවිතය සකසා ගනියි.

කලා කද්ර් යනු අපට පසුව ඇති සහමුලින් ම වසං වී ඇති රහසකි. එය අල්ලාහ් පමණක් දනියි. ඒ සමග මිනිසා පැහැදිලි නිදහසක් ඇත්තකු සේ සිටියි. ඒ පැහැදිලි නිදහස අප ඉදිරියෙහි තිබීම ද අපගේ බැල්මට හා දැනුමට එකඟවන්නක් වේ. එබැවින් අපට ඉදිරියෙන් ඇති දෙයින් යහපත තෝරා ගන්නේ ද, අයහපත තෝරාගන්නේ ද, මෙලොව හා පරලොව ජීවිතයේ ජයග්‍රහණය තෝරා ගන්නේ ද, පරාජය තෝරාගන්නේ ද, යන්න පිළිබඳ නිශ්චය වශයෙන් ම අල්ලාහ් අපගෙන් විමසනු ලබයි. එබැවින් අල්ලාහ්ගේ කැමැත්ත පරිදි ම සියල්ල සිදු වේ, යන විශ්වාසය ඇති ව අපගේ ක්‍රියා නිදහසට එකඟ ව ෂරීආවට ද මිනිස් දැනුමට ද අනුව ක්‍රියාකිරීම කලා කද්ර් පිළිබඳ නිවැරදි විශ්වාසයේ ප්‍රකාශනයක් වේ.

වරක් උමර් රළියල්ලාහු අන්හු තුමාගේ නායකත්වයෙන් සහාබාවරු පිරිසක් ෂාම් දේශය වෙත ගමන් කරමින් සිටියහ. ෂාම් දේශයේ කොළරා රෝගය ව්‍යාප්ත වෙමින් පවතින බව ආරංචි වූ උමර් රළියල්ලාහු අන්හු තුමා ඒ දෙස ගමන් කිරීම වැළැක්වීමට උත්සහ කළේ ය. එවිට අබූ උබෙයිදා රළියල්ලාහු අන්හු තුමා "ඔබ අල්ලාහුගේ කද්රයෙන් මිදී යාමට උත්සහ කරන්නේ ද"යි විමසුවේ ය. එයට "උමර් රළියල්ලාහු අන්හු තුමා" නැත, එක් කද්රයකින් තවත් කද්රයකට ගමන් කරන්නෙමු" යැයි පැවසුවේ ය. මෙම පිළිතුර කද්ර් පිළිබඳ ඇති මයාකාරී අදහස්වලට පැහැදිලි විස්තරයක් ලබා දෙන්නේ නොවේ ද?

අල්ලාහ් කද්රය ඇති කරනු ලැබුවේ ඇයි ?

මෙය කද්ර් පිළිබඳ මතු වන එක් පොදු පැනයකි. මෙයට සුදුසු පිළිතුර අල්ලාහ් විසින් ම පවසා ඇත.

- භූමියෙහි හෝ තොප කෙරෙහි හෝ ඇබැද්දක් නොවන්නේ ය. එය අප සිදු කරන්නට පෙර පුස්තකයෙහි ලියා තැබීම ඇත්තෙන් ම අල්ලාහුට ලෙහෙසි ය. (අල්ලාහු එය තොපට දන්වන්නේ) තොපෙන් අත් මිදුණ දෑය ගැන දුක්මුසු නොවන පිණිසක් අල්ලාහු තොපට දුන් දෑය ගැන උදම් නොවනු පිණිසත් ය. (57 අල් හදීද් :22-23)

  සිත කළකිරීම හා සිත පිනවීම යන දෙක ම මිනිසාට මධ්‍යස්ථව බාධා කරන බෙලහීනතා ය. කද්ර් පිළිබඳ විශ්වාසය එම බෙලහීනතාවලින් මිනිසා මුදා ගනියි.

- නබි තුමාණෝ මෙසේ පැවසූ සේක "මුඃමින්වරයකුගේ කරුණු ආශ්චර්යජනක ය. එබැවින් සියලු කරුණු ඔහුට යහපත් වන ලෙස ම පවතියි. ඔහුට යම් විපතක් සිදු වූයේ නම් ඉවසයි. ඔහුට එය යහපත් ලෙස ම පවතියි. ඔහුට යම් යහපතක් සිදු වූයේ නම් දෙවියන්ට ස්තුතිවන්ත වෙයි. එය ද ඔහුට යහපතක් ලෙස ම පවති." (බුහාරි)

එබැවින් අල්කුර්ආනය සුන්නාහ් ආදියට අනුකූල ව පෙර මිනුම විශ්වාස කරන මුඃමින්වරයෙකු සැමවිට ම තෘප්තිමත් මනසක් ඇත්තකු සේ ද, ඉවසිලිවන්තයකු සේ ද අල්ලාහ්ට තුති පුදන්නකු සේ ද සිටින්නේ නම් කිසි විටක දුකට පත්වන්නේ නැත. සිත් තැවුලට පත්වන්නේ ද නැත. සිදු වීමට නියමිත හානියෙන් අත්දැකීම් ලැබ තව දුරටත් උත්සහ කරන්නකු ලෙස ම සිටියි. නබි වරුන්ගේ ද සහාබාවරුන්ගේ ද මගපෙන්වීම මෙය වේ.

පාඩමේ ඇතුළත් වැදගත් අරාබි වචන

۞ الْقَضَاءُ وَالْقَدَرُ ۞ الْقُدْرَةُ ۞ الإِرَادَةُ ۞ الإِلـهِيَّاتُ ۞ الجَبَرِيَّةُ ۞ القَدَرِيَّةُ ۞ المُعْتَزِلَةُ ۞ المُرْجِيَةُ ۞ الْعِلْمُ

අභ්‍යාසය

1. කලා කද්ර් යන වචනවල අර්ථය කුමක් ද?
2. "එක් කද්රයකින් මම තවත් කද්රයකට යන්නෙමි" යන උමර් රලියල්ලාහු අන්හු තුමාගේ අදහස පැහැදිලි කරන්න.
3. කලා කද්ර් පිළිබඳ ඇති වැරදි විශ්වාස සඳහන් කරන්න.
4. ඉස්ලාමීය මූලික කරුණු මත පෙරමිනුම විශ්වාස කිරීම මඟින් ලැබෙන ප්‍රයෝජන ලැයිස්තුගත කරන්න.